**බේරුවල ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බේරුවල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතියේ අංක 3.27 සිට 3.32 දක්වා පරිච්ඡේදයන්ට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | 2024 වර්ෂයේ මුදල් ප්‍රවාහය නිවැරදිව පිළියෙල කරන බව. | ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) ප්‍රමිතියේ අංක 5.14 ප්‍රකාරව අස්ථිත්වය විසින් තොග නිකුත් කිරීම සම්බන්ධයෙන් භාවිතා කළ ක්‍රමය සහ තොග අගය කිරීමේ ක්‍රමය ගිණුම්කරණ ප්‍රතිපත්ති තුල හෙළිදරව් කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.19,773,513 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලි රු.675,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මු.රෙ 104(4) | වාර්තාගත වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහි ව ක්‍රියා මාර්ග ගෙන ඇති බව. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ 108 | 2022 වර්ෂයේ සිදු වී තිබුණු කැබ් රථ අනතුර සඳහා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ වන විට පරීක්ෂණ සිදු කෙරෙමින් පවතින අතර එය අවසන් වූ පසු අදාල ක්‍රියා මාර්ග ගන්නා බව. | -එම- |
| (iii) මු.රෙ 1645 | සභාව සතු වාහන 10 ක් සඳහා ධාවන සටහන් පත් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව. | -එම- |
| (iv) මු.රෙ 1646 | සභාවට අයත් වාහනවල මාසික සාරාංශය සහ ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.8,048,882 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.1,640,489 විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 25,918,429 | 25,600,161 | 34,037,739 | 15,835,000 | 23,854,295 | 29,253,576 | 19.633,435 | 25,754,967 |
| (ii) | කුලී | 23,255,552 | 19,086,953 | 17,124,743 | 3,848,205 | 22,921,850 | 20,825,028 | 23,330,393 | 5,952,825 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,133,000 | 4,233,205 | 4,184,806 | 793,400 | 4,130,000 | 4,102,000 | 3,893,040 | 898,500 |
| (iv) | වෙනත් ආදායම් | - | - | - | - | 100,000,000 | 152,309,224 | 189,838,595 | 115,798,726 |
| | | 53,306,981 | 48,920,319 | 55,347,288 | 20,476,605 | 150,906,145 | 206,489,828 | 236,695,463 | 148,405,018 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු කාල විශ්ලේෂණය අනුව වර්ෂයකට අඩු හිඟය රු.1,627,484 ක්ද, වර්ෂ 01ත් 03 ත් අතර හිඟය රු.5,130,206 ක්ද, වර්ෂ 03 ත් 05 ත් අතර හිඟය රු.2,433,376 ක්ද, වර්ෂ 05 ත් 10 ත් අතර හිඟය රු.4,464,338 හා වර්ෂ 10 යට වැඩි හිඟය රු.2,179,593 ක් විය. | වර්ෂ 05 ත් 10 ත් අතර සහ වර්ෂ 10 ට වැඩි හිඟ දේපළ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ඒ අනුව කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) කුලී**

| | | |
|---|---|---|
| (i)සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.5,952,825 ක් වූ කඩ කුලී හිඟයෙන් වර්ෂය තුලදී රු.1,908,648ක් හෙවත් සියයට 32 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදලින් රු.367,401 ක් අයවී ඇති බවත් රු.561,146 ක් කපා හැරීමට අනුමැතිය ඇති බවත් රු.158,375 ක් සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇති බව. | -එම- |
| (ii) වර්ෂ 03 ක සිට පවතින හිඟ කඩකුලී රු.689,762 ක් අය කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ද ක්‍රියා කර නොතිබුණි. | නඩු පැවරීමට කටයුතු කර ඇති බව. | -එම-. |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.39,535,856 ක් හා මුද්දර ගාස්තු රු.126,995,067 ක් විය. | උපලේඛන පිළියෙල කිරීමට කටයුතු කර ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බේරුවල ප්‍රාදේශීය සභාවේ විශාල වශයෙන් රැස්වන කසළ බැහැර කරලීම සඳහා දිගුකාලීන ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | කොම්පෝස්ට් අංගනයේ ධාරිතාව අනුව දිරන කසළ එම ස්ථානයට යවන අතර ඉතිරි කොටස් පුද්ගලික ඉඩමක බැහැර කරනු ලබන බව. | කසළ බැහැර කිරීම පිළිබඳ ඇති ගැටළුව පිළිබඳව වගකිවයුතු ආයතන දැනුවත් කර තිරසර විසඳුමක් ලබාගත යුතුය. |
| (ආ) බේරුවල ප්‍රාදේශීය සභාවට අයත් සෝ සාතකාගාරයේ ගවයන් සෞඛ්‍යාරක්ෂිත මැරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොතිබුණි. | අඩුපාඩු සකස් කිරීමට මූල්‍ය ප්‍රතිපාදන නොමැති නිසා ප්‍රමාදයන් සිදු වී ඇත.ඉදිරියේදී ප්‍රමාණවත් ඉඩ පහසුකම් නිර්මාණය කරන බව . | සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද යටතේ කාර්යය සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සෝ සාතකාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රය ලබාගෙන නොතිබූ අතර එහි ජලය ක්‍රමවත්ව බැහැර කිරීමට ක්‍රමවේදයක් නොමැති බැවින් අපජලය ඉඩමට යාබඳ බෙන්තර ගඟට මිශ්‍ර වී තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය විසින් බලපත්‍ර ලබාදීමට සිදු කළ ස්ථානීය පරික්ෂණයේදී අඩුපාඩු පෙන්වා ඇති අතර ඒවා ඉදිරියේදී නිවැරදි කර ගැටළු නිරාකරණය කරන බව. | පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සැලසුම් කමිටුවක් එකම දිනක එකම වේලාවක පවත්වා තිබියදී උප කාර්යාල මට්ටමින් අත්සන් ලේඛන 05 ක් සකස් කර කමිටු 05 කට සහභාගි වූ ලෙස සලකා 2022 දෙසැම්බර් 06 සිට 2023 ජුනි 30 දක්වා කාල සීමාවට අදාලව ගෙවිය යුතු මුදල ඉක්මවා දීමනා ලෙස රු.484,000 ක් ගෙවා තිබුණි. | රු76,500 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | සභා අරමුදල් නිසි ලෙස වැය කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි හෝටල් සංඛ්‍යාව පිළිබඳ නිසි සමීක්ෂණයක් සිදු කිරීමකින් තොරව හෝටල් 24 කින් පමණක් බදු අය කිරීම් සිදු කර තිබුණි. | එම හෝටල් ලබා දුන් තොරතුරු අනුව බලපත්‍ර ගාස්තු අයකර ඇති අතර සංචාරක මණ්ඩලයෙන් තොරතුරු ඉල්ලා ඇති බව. | ලියාපදිංචි හෝටල් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර බදු අය කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ට්‍රැක්ටර් රථයක් වර්ෂ 05 කට අධික කාලයක සිට අළුත්වැඩියාවකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | අංක RD-9469 දරන ට්‍රැක්ටර් රථය ඉංජිනේරු වාර්ථාවක් ලබාගැනීමට යොමු කර ඇති අතර අනෙක් අත් ට්‍රැක්ටර් 3 මේ වන විට අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති බව. | වත්කම් කාර්යක්ෂමව භාවිතයට ගත යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බස්නාහිර පළාත් සභාවෙන් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු JOHN DEER වෙරළ පිරිසිදු | රථයේ අළුත්වැඩියා කටයුතු වලින් 75% ක් මේ වන විට | අළුත්වැඩියා කටයුතු කාලීනව සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කිරීමේ රථය 2017 ඔක්තෝබර් 13 දින සිට ධාවන තත්ත්වයේ නොපැවති අතර 2018 වර්ෂයේ සිට අළුත්වැඩියාව සඳහා පුද්ගලික ආයතනයක් වෙත යොමු කර තිබුණද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එය සභාවට භාර ගෙන ධාවනයට එක් කර නොතිබුණි. | අවසන් වී ඇති බැවින් නුදුරේදීම අළුත්වැඩියා කටයුතු වලින් අනතුරුව ධාවනයට එක් කිරීමට නියමිතව ඇති බව. | |
| (ආ)සභාව භාවිතා කරන වාහන 10 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම වාහන වල හිමිකම පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වාහන නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.6 **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටෝනර් ප්‍රසම්පාදනයේදී අවම ලංසුව ප්‍රතික්ෂේප කර වැඩි මිලකට මිලදී ගැනීම සිදු කිරිම නිසා සභාවට රු.316,560 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි. | කොන්දේසි දෙකක් අනුව තාක්ෂණ කමිටුව මෙය නිර්දේශ කර තිබූ බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.7 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අඩු ආදායම්ලාභි පවුල් සඳහා වැසිකිළි තැනීමේ ව්‍යාපෘතියේදී දිස්ත්‍රික් මිල කමිටුව විසින් බ්ලොග් ගලක් සඳහා නියම කරන ලද මිල ඉක්මවා ගෙවීම නිසා රු.208,000 ක අලාභයක් සිදු වී තිබුණි. | වෙළඳ පොලෙහි පැවති මිළ ගණන්වලට අනුව භාණ්ඩ මිලට ගැනීමට සිදුවී ඇති බව. | සිදු වූ අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කළ යුතුය. |

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය, මියගිය නිලධාරින් හා සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.1,036,338 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |